# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## උපකුලපති තනතුර

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වගන්තිය හා ඉන් පසුව කරන ලද සංශෝධන සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 03/2023 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් නියමයන් හා කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය කළමනාකරණය කර මෙහෙයවීම සඳහා සුදුසුකම් ලත් පළපුරුදු පුද්ගලයින්ගෙන් උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙක් වන අතර ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ප්‍රධාන අධ්‍යයන නිලධාරී ද වේ. ඔහු/ඇය නිල බලයෙන් විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජිකයෙකු වන අතර ඒ දෙකෙහිම සභාපතිවරයා ද වේ.

1978 අංක 16 දරන සංශෝධිත විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපති ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කලින් ධූරය අත්හැර ගියහොත් හෝ මිස වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතෙක් හෝ ධූර කාලය අවසන් වනතෙක් හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළයුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, විධිමත් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම, හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ද උපකුලපතිවරයා වගකිව යුතු වේ. උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ කටයුතු කළමනාකරණය කිරීමේදී විනිවිදභාවය හා මූල්‍ය වගකීම පවත්වාගත යුතු වේ. උපකුලපතිවරයා විසින් පාලක සභා තීරණ ක්‍රියාත්මක කිරීම, විශ්වවිද්‍යාලය තුළ සහ එහි සාමාන්‍ය පරිපාලන කටයුතුවලදී විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

උපකුලපතිවරයා අධ්‍යයන විශිෂ්ටත්වය පවත්වා ගැනීමට කැපවිය යුතු අතර ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ. අයදුම්කරු කැපී පෙනෙන ජයග්‍රහණ, විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත උසස් දක්ෂතා ඇති පුද්ගලයෙකු විය යුතු අතර ඔහුට/ඇයට ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ විවිධ අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් කටයුතු කිරීමේ මනා සන්නිවේදන හැකියාවක් තිබිය යුතුය. ප්‍රජාව කෙරෙහි ඇති කැපවීම ඇතුළුව විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳ ඇති අවබෝධය අයදුම්කරු විසින් ප්‍රදර්ශනය කළ යුතුය. (විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන *www.ou.ac.lk* වෙත පිවිසෙන ලෙස අපේක්ෂිත අයදුම්කරුවන්ට ආරාධනා කරනු ලැබේ.)

උපකුලපති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලය ලැබීමට හිමිකම් ලබන අතර, අදාළ වැටුපෙන් 15% ක් වූ සංග්‍රහ දීමනාවකට සහ තනතුරට අදාළ වෙනත් දීමනා ලැබීමට හිමිකම් ලබයි.

පත්වීම සඳහා වූ ක්‍රියා පරිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 03/2023 හා 2023.04.10 දින දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ නිර්ණායකයන්ට අනුකූල වන අතර එම චක්‍රලේඛය : *https://www.ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf* වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

අපේක්ෂකයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතුය. පහත සඳහන් ලියකියවිලි අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

(i) උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ජීව දත්ත.

(ii) විශ්වවිද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ පෞද්ගලික දැක්ම සහ උපකුලපති තනතුරට පත් වුවහොත් අපේක්ෂකයා විසින් අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(iii) වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වේ නම් හෝ අයදුම්කරුවෙකු මෙයට පෙර විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුර හොබවා තිබේ නම් ඉහත සඳහන් (i) හා (ii) ලියකියවිලිවලට අමතරව ඔහුගේ/ඇයගේ පළමු ධූර කාලය තුළ අත්පත් කරගන්නා ලද සාධන ඉස්මතු කරමින් වාර්තාවක්.

(iv) අයදුම්කරු රාජ්‍ය සේවයේ, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවා යෝජකයාගෙන් ලබා ගන්නා ලද ලිපියක්.

ඇගයීම් කමිටුව විසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයින් කැඳවනු ලැබේ. විශේෂිත තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට ඇගයීම් කමිටුව ඉදිරියේ පෙනී සිටීමට නොහැකි නම්, ඔහුට/ඇයට **වීඩියෝ සම්මන්ත්‍රණ** හරහා සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් ලැයිස්තුගත කර ඇති පාලක සභාව විසින් අනුමත කරන ලද අපේක්ෂකයින් අවම වශයෙන් විනාඩි දහයක (10) කාල සීමාවක් හෝ විනාඩි පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේෂ පාලක සභා රැස්වීමට කැඳවනු ලැබේ.

අයදුම්පත් **ඩබ්ලිව්.එල්. වින්ධ්‍යා ජයසේන මිය, ලේකම්, පාලක සභාව, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ** යන ලිපිනයට **2024.01.10 වන දින ප.ව. 3.00ට** පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ඉහත කාර්යාලයට පැමිණ භාරදීමට හැකිය. නියමිත දිනට පසු අයදුම්පත් භාරගනු නොලැබේ. අදාළ ලිපිලේඛන ඇතුළු අයදුම්පත්/ නාම යෝජනා අඩංගු කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතුය. ඊට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක් PDF ආකෘතියකින් වෙනත් ඕනෑම ආධාරක ලේඛනයක් සමඟ *registrar@ou.ac.lk.* යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය.

**ඩබ්ලිව්.එල්. වින්ධ්‍යා ජයසේන,**
**ලේඛකාධිකාරී/ලේකම්, පාලක සභාව**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,**
**නාවල,**
**නුගේගොඩ.**

**2023 දෙසැම්බර් 10 වන දින.**

University Web Page : www.ou.ac.lk